# හිතුවක්කාර යාළුවෝ



එන්. ජී. සනුති නිහංසා කුමාරරත්න

හිතුවක්කාර යාළුවෝ

එන්.ජී. සනුති නිහංසා කුමාරරත්න

2023.10.24

**පිදුම**

මගේ ආදරණීය

අම්මාටත් ,

අප්පච්චිටත්

මට අකුරු කරවු

ගුරු මෑණිවරුන්ටත්

ගෞරවයෙන් පුදමි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීම යි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරිම මේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතු වුන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකනි දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමකු ළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපතක් රමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,

විදුහල් පතනිය,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

2023.10.20



එක ගමක හිටියා නිමල් හා මලිත් කියලා යාළුවෝ දෙන්නෙක්. මේ යාළුවෝ දෙන්නා හැමදාම හවසට සෙල්ලම් කරන්න පුරුදු වෙලයි හිටියේ.



දවසක් සෙල්ලම් කරන අතරේ "හරිම මහන්සි, නිමල්" කියමින් මලිත් ළඟ තිබුණු ගලක් උඩ ඉඳගත්තා. මහන්සි අරින අතරේ "නිමල්, මට හොඳ අදහසක් ආවා" මලිත් නැඟිටමින් කීවා.

"මොකක්ද?" නිමල් ඇහුවා.

"අපි පේර කඩන්න කැලේට යමුද?"

"ආ.... ඒ අදහස නම් හොඳයි." නිමල් හයියෙන් කිව්වා.



යාළුවෝ දෙන්නා සතුටින් කරට අත දාගෙන කැලෑව පැත්තට ගියා.



කැළෑවේ පේර ගසක් ළඟ නතර වුණා. බිම තිබුන කෝටුවකින් ඇති තරම් පේර කඩා ගෙන ඇති වෙනකම් පේර කෑවා.

දන්නෙම නැතුව රෑ වුණා. ගෙදර යන්න පාර හොයා ගන්න බැරි උනා.



එක එක භයානක ශබ්ද ඇහෙන්න පටන් ගත්තා. ඒ දෙන්නා හොඳටම භය වෙලා බදාගෙන හයියෙන් කෑ ගැහුවා.

ළමයිගේ කෑ ගැසීම කැලෑවේ පැතිරුණා.

"අන්න අතනින් දිලිසි දිලිසි එළියක් එනවා" නිමල් කිවුවා. දෙන්නම එළිය එන පැත්තට දිව්වා.



හරි පුදුමයි! ඒ එළියෙන් හරිම ලස්සන සුරංගනාවියක් මතු වුණා.



සුරංගනාවියට සමනලයෙක්ගේ වගේ රන්වන් පාට අත්තටු තිබුණා.

පුංචි යාළුවෝ දෙන්නාගේම හිත් වලට සතුටක් ඇති උනා.

“ඇයි ඔයාලා අඬන්නේ” සුරංගනාවි ඇහුවා. යාළුවෝ එයාලා අතරමං උන විදිහ සුරංගනාවියට කිවුවා.



“අම්මලාට නොකියා පොඩි ළමයි කොහෙවත් යන්නේ නෑ නේ” සුරංගනාවි කිව්වා.



"අපි මේ වගේ වැඩ ආයේ කරන්නේ නෑ".

"ඔයාලා හොඳ ළමයිනේ, වැරැද්ද පිළිගත්තා. ඔන්න මම ඔයාල ගෙදර යවනවා".

සුරංගනාවි යෂ්ටියෙන් තුන් සැරයක් දෙන්නාගේම ඔළුවට තට්ටු කළා.



යාළුවෝ දෙන්නා පුදුම කරමින් දෙන්නම ගෙදරට ඇවිල්ලා. යාළුවෝ දෙන්නට හරි සතුටුයි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම, ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම, වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්,

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ,

2023.10.20